# මෙත්තාරා සමග කරළියට එන අපේ කාලයේ අසඩක්

# චම්පා බුද්ධිපාල



හුණුවටයේ කතාව නැරඹූ කියවූ සැමට අසඩක් ගැන අමුතුවෙන් හඳුන්වාදිය යුතු නැත. මන්ද නීතිය අකුරට ක්‍රියාත්මක කළ මතභේදයට තුඩු දෙන තීන්දු ප්‍රකාශ කළ අසඩක් අපේ වීරයෙකි. සිඩ්නි නුවර ජීවත්වන අපේ අසඩක් කලාව වෙනුවෙන් තම කාලය ශ්‍රමය කැප කරන නීතිඥයකු ලෙස ජීවිතය ආරම්භ කර විනිසුරුවරයෙකු ව සිට මනමේ නාට්‍යයේ වැදි රජු ගේ භූමිකාව නිරූපනය කරමින් වේදිකාව අතික්‍රමණය කළ චම්පා බුද්ධිපාලයි.

ඔහු මේ දිනවල ඔහුගේ නවතම නිර්මාණය - මෙත්තාරා - සමගින් කරළියට එන්නට සූදානම් වෙයි. ඒ ගැන කතා කරන්නට අපි පසුගියදා ඔහු හමුවුණා.

**මොකක්ද මේ අලුත් වැඩේ?**
ඔව්.. මේක අලුත් වැඩක් තමයි.. දැන් නෙවෙයි.. මෙයිට අවුරුදු 50 කට විතර පෙර...

**ඒ කිව්වේ?**
නාඩගම් ශෛලිය ගම් මට්ටමේ තිබුණ යුගයක මහාචාර්ය සරච්චන්ද්‍රයන් මේ ශෛලිය ඉතාමත්ම චමත්කාරජනක අන්දමින් ප්‍රසිද්ධ වේදිකාවට ගෙනාවා. අදටත් අප රස විඳින එතුමාගේ කැපවීම නිසා බිහිවුණ මනමේ හා සිංහබාහු තවමත් ගම් නියම්ගම් වල සැරි සරනවා. මටත් භාග්‍යයක් තිබුණා එතුමාගේ නාට්‍ය කීපයකටම සම්බන්ධ වන්නට. එයිනුත් විශේෂත්වය වන්නේ මනමේ නාටකයේ වැදි රජුගේ භූමිකාව රඟදක්වන්නට මට ලැබුණ අවස්ථාව. ඒ වගේම අනිත් කාරණාව තමයි අවුරුදු ගණනාවක් ගියත් මේ සම්ප්‍රදායෙන් අලුත් යමක් කරන්නටත් මෙය ජනතාව අතරට රැගෙන යන්නටත් විශේෂයෙන්ම විදේශික රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයනගේ රසවින්දනය සඳහාත් නාඩගම් ශෛලියෙන් මේ නාට්‍යය නිර්මාණය කළේ.

මනමේ සිංහබාහු වලින් පස්සෙ දැන් අවුරුදු පනහක් විතර ගත වෙලා තිබුණත් මේ සම්ප්‍රදායෙන් මතක හිටින නව නාට්‍යනිර්මාණයක් මා දන්නා පමණින් බිහිවුණේ නැහැ. ඒ නිසා තමයි ඒ සම්ප්‍රදාය ඒ කියන්නෙ දේශීය නාට්‍ය සම්ප්‍රදාය තවත් ඉදිරියට ගෙන යාමේ අරමුණෙන් මෙත්තාරා නමින් මේ නාට්‍යය නිර්මාණය කළේ.

**මේ ඔබගේ තුන්වන නිර්මාණය නේද?**
තුන්වන නිර්මාණ නෙවෙයි. මේ වන විට මම වසර ගණනාවක් තිස්සේ බොහෝ නිර්මාණ සිඩ්නි නුවර සිටින ප්‍රේක්ෂකයන්ට ඉදිරිපත් කර තිබෙනවා. ඒවාට පරිබාහිරව මවිසින් නිර්මාණය කරන ලද තුන්වන ස්වන්ත්‍ර දීර්ඝ නාටකය මෙයයි.

**ඇයි ස්වතන්ත්‍ර කියන එක අවධාරණය කළේ?**
මම වෙනත් අයගේ නිර්මාණ රාශියක් කලින් කලට ප්‍රති නිර්මාණය කළා. මං එහෙම කළේ ඒවා ජනතාව අතරට ගෙනයන්නට අවශ්‍ය නිසා. නමුත් ක්‍රිෂ්ණා දස්කොන් හා මෙත්තාරා මගේම ස්වතන්ත්‍ර නිර්මාණයි. ක්‍රිෂ්නා බිඟි නලුවක් ලෙසත් දස්කොන් තාත්වික ශෛලිගත සම්මිශ්‍රන ශෛලියකිනුත් මෙත්තාරා නාඩගම් ශෛලියට අනුව දේශීය නාට්‍ය සම්ප්‍රදායෙනුත් මම නිර්මාණය කළා.

**මෙත්තාරා නාට්‍යයේ පසුබිම ගැන යමක් කියනවා නම්**
මට මෙත්තාරා නිර්මාණය කරන්න මූලිකම සිද්ධිය හැටියට කියන්නට හැකි වන්නේ මේ වන විට නොයෙකුත් ආකාරයේ ව්‍යසනයන් බුදු දහමට එල්ල වී තිබීමයි. බොහෝ බටහිර රටවල බොහෝ අය ජීවිතයේ නිස්සාර බව වටහාගෙන බෞද්ධාගම වැළඳ ගැනීමත් එහි ඇති ගැඹුරු දර්ශනය අධ්‍යනය කිරීමට පෙළඹවීමත් දකින්නට ලැබෙද්දී අපේ රටේ සමහරුන් වෙතින් ධාර්මික බව තුරන් වෙමින් තිබෙනවා මම දකිනවා. පිරිහෙමින් පවතින ආගමික භක්තිය නැවත ජනිත කිරීම මේ අවස්ථාවේ වැදගත් කියලා මම හිතනවා. ජාතක කතා තුළින් බොහෝ විට ඉස්මතු වන්නේ බෝසත් ගුණයයි. මෙත්තාරා ඉතුළින් මම කතා කරන්නට යන්නේ අධ්‍යාත්මික හා ද්‍රව්‍යවාදී ගැටුමයි. තවත් විදියකින් කියනවා නම් ධෛර්මය හා අධර්මය අතර ගැටුමයි. මේ අනුභූතිය වඩාත් තීව්‍ර ලෙස ඉදිරිපත් කිරීම සඳහා මම නාඩගම් ශෛලිය භාවිතා කරන්න හිතුවා.

**මේ තරම් විශාල කාර්යයකට ඔබ සම්බන්ධ කරගන්නා පිරිස කවුද?**
මම මේ සඳහා ලංකාවේ සිටින අති දක්ෂ ශිල්පීන් කීපදෙනෙක් තෝරා ගත්තා. අද අප කවුරුත් දන්නවා නාඩගම් ශෛලිය ගැන කතා කරනවා නම් සිංහල නාඩගම් ශෛලියේ රන් අකුරෙන් ලියවුණ නම් කීපයක් තියෙනවා. එයින් මූලිකව කියවෙන නමක් තමයි නිශ්ශංක දිද්දෙනිය. ඒ වගේම වජේරත්න වරකාගොඩ. මට හරි සතුටුයි මේ ප්‍රවීණයන් දෙදෙනාම මේ නාට්‍යය සඳහා මට දායක කරගන්නට හැකිවීම. ඒ එක්කම ඉන්දිකා උපාමාලි. කේමදාස මාස්ටර් යටතේ සංගීතය ප්‍රගුණ කර අද සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරියක් ලෙස සේවය කරන ඉන්දිකා උපමාලි ලංකාවේ ප්‍රථම ඔපෙරාව වන අග්නි හි ප්‍රධාන භූමිකාව රඟපෑවා. ඇගේ ගායන හා රංගන හැකියාව අති විශිෂ්ටයි. ඇයත් මෙත්තාරාහි ප්‍රධාන නිළි භූමිකාවට පණ පොවනවා. නාඩගම් සම්ප්‍රදායේ බොහෝ නාට්‍ය වල අංග රචනය කරමින් රංගනයෙන්ද දායක වුණ වසන්ත විට්ටච්චි අති දක්ෂ ජනප්‍රිය වේදිකා හා ටෙලිනාට්‍ය රංග ශිල්පියකු වන කුමාර තිරිමාදුර සහ දක්ෂ රංග ශිල්පියකු වන අජිත් ද සිල්වා මෙහි රඟපානවා. එසේම මට විශාල ශක්තියක් වන මගේ බිරිඳ චන්ද්‍රානි බුද්ධිපාල ජයන්ත රත්නායක තාරා බුද්ධිපාල සම්පත් ජයවීර තිලක් රණසිහ සහ අසේල ජයන්ත රංගනයෙන් දායක වෙනවා. අප අතර සිටින දක්ෂ සංගීත අධ්‍යක්ෂවරයකු වන ඉන්ද්‍රජිත් මිරිහාන මෙත්තාරා හි සංගීතය නිර්මාණය කළා. පණ්ඩිත් අමරදේව හා විශාරද නන්දා මාලිනී ගායනයෙනුත් ලංකාවේ සිටින අති දක්ෂ මද්දල් වාදකයකු වන මහේන්ද්‍ර ගුණසිංහ මද්දල් වාදනයෙනුත් අපට එක්වෙනවා.



**මෙත්තාරා වේදිකාගතවන්නෙ කවදාද?**
මෙත්තාරා ජූලි මාසයේ 21 වන දින කැන්බරා මෙල්රෝස් හයි ස්කූල් ශාලාවේදීත් ජූලි 28 සිඩ්නි හි පැරමටා රිවර්සයිඩ් තියටර් හිදීත් අගෝස්තු 4 වන දා මෙල්බර්න් ඩැන්ඩිනොන් ඩ්‍රම්ස් තියටර් හිදීත් වේදිකා ගත වනවා.

වසර ගණනාවකට පසු චම්පා බුද්ධිපාල ඉදිරිපත් කරන මෙත්තාරා පර්යේෂණාත්මක වේදිකා නිර්මාණය හුදෙක් නාට්‍යයකට වඩා ඔබ්බෙන් ගිය නිර්මාණයක් බව අපට වැටහෙයි. ඉතා විශාල කාලයක් ශ්‍රමයක් හා පිරිවැයක් දරා නිමවා ඇති විශිෂ්ට නිර්මාණයක් ලෙස මෙත්තාරා ඔබේ සිතේ සදා නොමැකෙන ලෙස රැඳී පවතින නිර්මාණයක් වන බව අපට විශ්වාසය. මේ අත්දැකීම විඳ ගන්නට ඉඩක් දැන්ම වෙන්කර තබා ගන්නට අමතක නොකරන්නැයි අපි ඔබට දන්වා සිටිමු.

ශ්‍රීනාත් මද්දුමගේ

